# 'පට්ඨාන' ධර්ම දේශනා මාලාව
# 'වීථි වාර' – 'උපනිස්සය ප්‍රත්‍යය'
# 17.01.2019

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

තුලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරිහත් වූ ශාන්තිනායක ධර්ම රාජයාණන් වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරනවා. මාගේ නමස්කාරය වේවා! ශාන්තිනායක බුදුරාජාණන්වහන්සේගේ බුදුනුවණින් දැක දැන අවබෝධකොට ගත්තා වූ ලෝකයාට කරුණාවෙන් දේශනාකොට වදාළා වූ ශ්‍රී සද්ධර්ම රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා. මාගේ නමස්කාරය වේවා! ඒ උතුම් වූ ධර්ම මාර්ගයේ ගමන්කොට පරම ශාන්ත වූ නිර්වාණ ධාතුවට එක් උනාවූ නිවනින් නිවී ගියාවූ අශ්ඨාර්යපුග්ගල මහා සංඝරත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා. මාගේ නමස්කාරය වේවා!

බුද්ධ රත්නයේ ධම්ම රත්නයේ සංඝ රත්නයේ අනන්ත වූ අපරිමාණ වූ ගුණානුභාව බලයෙන් සහ තුනුරුවන් කෙරෙහි සිත පිහිටුවා නමස්කාර කරගැනීමේ කුසල චේතනාවන්ගේ ධර්ම ආනුභාව බලයෙන් සහ මේ පින්වත් සැමදෙනාම දියුණුකොට වඩාගෙන තිබෙන්නා වූ දානමය සීලමය භාවනාමය කුසල ධර්මයන්ගේ සීල සමාධි ප්‍රඥා ධර්මයන්ගේ අනුභාව බලයෙන් අද දවසට අපි මේ පින්වතුන්ට කියලා දෙන්න බලාපොරොත්තු වන්නාවූ ධර්ම කරුණු ටික ඉතාත්ම හොඳින් අවබෝධ කරගන්න තේරුම් ගන්න සැම දෙනාටම සිහිය නුවණ යෝනිසෝමනසිකාරය අවධි වේවා! සියලු දෙනාගේම සිත්වලට මාර පාක්ෂික ධර්ම බලවේග ඇතුල් නොවේවා! ඒවාගේම ආධ්‍යාත්මය ඇතුලතින් හෝ වේවා පිටතින් හෝ වේවා කරදරයක් ඇති නොවී චිත්ත ඒකාග්‍රතාවයෙන් යුක්තව ධර්ම මනසිකාරයෙන් යුක්තව මේ ධර්ම කාණ්ඩය තේරුම් අරගෙන සැම දෙනාටම නිවනින් සැනසෙන්න ලැබේවා! නිර්වාණ ධාතුව සුවසේම අවබෝධ වේවා! කියලා මෛත්‍රීයෙන් ආශිර්වාද කරනවා. එසේ ආශිර්වාද කරමින් අද මම ධර්ම කරුණු ටිකක් මේ පින්වතුන්ට මතක් කරනවා.

අපි මේ පට්ඨානය තමයි පහුගිය කාලේ කථා කරගෙන ආවේ. මගේ මතකයේ හැටියට අපි නවත්වපු තැනක් තිබුණා පට්ඨාන දේශනාවේ. ඒ තමයි නිස්සය කියන ප්‍රත්‍යයේ වීථිවාර පිළිබඳව මතක් කළා. අද මේ පින්වතුන්ට මම වීථිවාරයක් කියලා දෙන්න බලාපොරොත්තු වෙනවා ප්‍රත්‍යය ධර්මය පිළිබඳව. ප්‍රත්‍යය විභාගයේදී වීථි ගැන කීමයි චිත්ත වීථි කීමයි කියන එක විදි දෙකක්. දෙකේම තිබෙන්නේ වීථි කියන වචනය. නමුත් වීථි කියන වචනය පාවිච්චි කළාට ඒ වීථි කියන වචන දෙකෙන් කියා දෙන කාරණා දෙක දෙකක්. අරමුණක් ඔස්සේ අරමුණකට බැහැගෙන අරමුණකට සම්බන්ධ වෙලා සිත් පේළියක් ගලාගෙන යන එකටත් කියනවා චිත්ත වීථි කියලා. අපි ඒ කාරණය දැන

ගත්තා. ඒ තමයි භවාංග - භවාංග චලන - භවාංග උපච්ඡේද - පංච ද්වාරාවජ්ජන ආදී වශයෙන් සිත් පේළි චිත්තක්ෂණ 17 කියලා කරුණු අරගෙන ඔය විදියට අපි ඉගෙන ගත්තා. මෙතැන කියවෙන්නේ හැබැයි ඒ විදියේ එකක් නොවෙයි. මේකේ තිබෙන්නේ ප්‍රත්‍යය ධර්මයන් ක්‍රියාත්මක වෙන විදිය ගැන පේළි ගස්සලා කියලා දෙන එකක්. ඒකයි අපි මෙතැනදී දැනගන්න ඕනෑ වෙන්නේ. ඉතින් මේ අද කියලා දෙන කාරණය තේරුම් ගන්න 'නිශ්‍රය' කියන එකයි 'උපනිශ්‍රය' කියන එකයි දෙකෙත් අදහස දැනගෙන ඉන්න එක හොඳයි.

නිස්සය කියලා කියන්නේ යම්කිසි දෙයක් හටගන්න පවතින්න පිහිටන්න වැඩෙන්න උදව්වෙන තැන, උදව්වෙන කාරණය කියන එකට. හැබැයි උපනිශ්‍රය කියන ඒකේ තිබෙනවා වෙනත් හයිය ගතියක්. උපනිශ්‍රය කියලා කියන්නේ යම්කිසි ධර්මයක්, අපි උදාහරණයකට කුසලයක් ගමු. ඒ කුසලය සිද්ධ වෙන්න බලවත්ම කාරණය කියන එක තමයි උපනිශ්‍රය කියලා කියන්නේ. මෙතැන කුසලය කියලා කියන්නේ අර අපි කථා කළ කාමාවචර භූමියේ තිබෙන කුසල් සිත් 8 + රූපාවචර භූමියේ තිබෙන කුසල් සිත් 5 + අරූපාවචර භූමියේදී කුසල් සිත් 4 ආදී වශයෙන්. මේවාගේ අස්සේ තිබෙන චෛතසික ධර්මත් එක්ක මොකක් හරි ආරම්මණයක් අල්ලගෙන පවතින මතුවෙන ධර්ම වලට කියනවා කුසල ධර්ම කියලා. නමුත් ඒ කුසල ධර්මයක් නිකම්ම එන්නේ නෑ. ඒ කුසල ධර්ම අපේ හිත් ඇතුලේ ඇතිවෙන්න මතුවෙන්න පැල වෙන්න හැදෙන්න දියුණු වෙන්න තව හේතුවෙන කාරණා අවශ්‍යයි. ඒවාට කියනවා ප්‍රත්‍යය වෙන කාරණා කියලා. ඒ ප්‍රත්‍යය වෙන කරුණ තමයි මෙතැන උපනිශ්‍රය වෙනවා කියලා කියන්නේ. උපනිශ්‍රය කියලා කියන්නේ බලවත්ම ශක්තිමත්ම උපකාරක ධර්මවලට. 'උපනිශ්‍රය ප්‍රත්‍යය' හඳුන්වාදෙන අවස්ථාවේ මේක අපි කථා කළා. මේ උපනිශ්‍රය ප්‍රත්‍යය සිද්ධ වෙන්න කරුණු තුනක් ඉදිරිපත් වෙනවා.

එකක් තමයි කුසලයක් හැදෙන්න වැඩෙන්න පිහිටන්න මතුවෙන්න බලවත් අරමුණක් ඇතිවෙන්න ඕනෑ. එතකොට තමයි උපනිශ්‍රය ප්‍රත්‍යය වෙන්නේ. ඒකට කියනවා අරමුණක් හැටියට බලවත්ව උපනිශ්‍රය වෙනවා, බලවත්ව ආරම්මණයක් වෙනවා කියලා. අනිත් එක තමයි අනන්තර උපනිශ්‍රය. ඉස්සර වෙලා පහළ වෙච්ච හිත එක්කම ඒකෙ හයියෙන් ඒකෙ බලයෙන් ඊළඟට හැදෙනවා සිතක්. ඒ කුසලය හැදෙන්න ඒක බලවත් උපකාරයක් වෙනවා. අනිත් එක තමයි ප්‍රකූර්තියෙන්ම තමන්ගේ හිතේ තිබෙන්නා වූ චෛතසික ධර්ම ඉදිපත් වෙලා කුසල ධර්ම ඇතිවෙන්න හේතුවෙනවා. ඔය විදියට 'ආරම්මණ උපනිශ්‍රය' 'අනන්තර උපනිශ්‍රය' 'ප්‍රකූර්ති උපනිශ්‍රය' කියලා උපනිශ්‍රය ධර්ම තුනක් මේ ප්‍රත්‍යය විභාගයේ කියල දෙනවා. මේ ටික ඉස්සෙල්ලා කියලා දුන්නා. අද මේ පින්වතුන්ට ඒකෙ වීථි වාරයක් කියලා දෙනවා. හැබැයි මේ පින්වතුන් අගහෙන ඉන්න ස්වභාවයෙන් මට තේරෙනවා කරුණු තුනම කියන්න ගියොත් පිරිසට පටලැවෙයි කියලා. 'ආරම්මණ උපනිශ්‍රය' 'අනන්තර උපනිශ්‍රය' 'ප්‍රකූර්ති උපනිශ්‍රය' තුනම එකට කියන්න ගියොත් පිරිසට හසුකරගන්න බැරි වෙයි කියලා හිතනවා. ඒක නිසා මේ පින්වතුන්ට මේක තේරුම්

ගන්න පහසු වෙන විදියට ආරම්මණ උපනිශ්‍රය කියන කාරණය විතරක් අරගෙන කියලා දෙනවා.

## 1) <u>පළවෙනි වීථිය</u>

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස උපනිස්සයපච්චයෙන පච්චයො – ආරම්මණූපනිස්සයො, අනන්තරූපනිස්සයො, පකතූපනිස්සයො.**

ඒ කියන්නේ කුසල ධර්මයක් තවත් කුසල ධර්මයකට පහළ වෙන්න ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙනවා. අපි දැන් ඕක ඉදිරිපත් කරගෙන බලමු කාටත් මේක සරලව තේරුම් ගන්න. ඒකෙ විග්‍රය මේ විදියට දක්වනවා. කුසල අරමුණක් කොහොමද කුසලයක් පහළ වෙන්න බලවත් අරමුණක් වෙන්නේ කියලා.

**ආරම්මණූපනිස්සයො – දානං දත්වා සීලං සමාදියිත්වා උපොසථකම්මං කත්වා, තං ගරුං කත්වා පච්චවෙක්ඛති, පුබ්බෙ සුචිණ්ණානි ගරුං කත්වා පච්චවෙක්ඛති, ඣානා වුට්ඨහිත්වා ඣානං ගරුං කත්වා පච්චවෙක්ඛති, සෙක්ඛා ගොත්‍රභුං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති, වොදානං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති, සෙක්ඛා මග්ගා වුට්ඨහිත්වා මග්ගං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති.**

**දානං දත්වා සීලං සමාදියිත්වා උපොසථකම්මං කත්වා, තං ගරුං කත්වා පච්චවෙක්ඛති**. හරිම ලස්සන පැහැදිලි විස්තරයක් මෙතැන තිබෙනවා.

**දානං දත්වා** = දානමය පිංකමක් කරලා

**සීලං සමාදියිත්වා** = සීලයක් සමාදන් වී

මේක හොඳට බලන්න. දානයක් දෙනවා කියලා කියන්නේ අතින් නොවෙයි. දානයක් දෙන්නේ හිතෙන්. දානය දෙන වේලාවේ හිතේ පහළ වෙන්නා වූ ධර්මයන්ට කියනවා කුසල ධර්ම කියලා. එතකොට දානය දෙනකොට කුසල ධර්ම පහළ උනා.

**සීලං සමාදියිත්වා** = සීලයක් සමාදන් උනා. පංච සීලය හරි ආජීවඅශ්ඨමක සීලය හරි නිත්‍ය සීලයක් සමාදන් වෙනකොට ඒ සමාදන් වෙන වෙලාවේ පහළ වෙන කුසල සිත් මේ අරමුණු කරන්නේ.

**උපොසථකම්මං කත්වා** = පොහොය දවසට පෙහෙවස් සමාදන් වෙන කොට උපෝසථය කරනකොට එතැනදී පහළ වෙනවා කුසල ධර්ම.

දැන් මේ වගේ අවස්ථා තුනකදී එනම් දානයක් දෙන අවස්ථාවේ කුසල් සිත් පහළ උනා. දැන් කුසල් සිත් පහළ වෙලා ඉවරයි. සීලයක් සමාදන් උනා. සමාදන් වෙන වෙලාවේ කුසල් සිත් පහළ උනා. ඒවා ඉවර උනා. ඊළඟට උපෝසථකර්මයක් කළා පොහොය දවසේ අටසිල් හරි දසසිල් හරි සාමාදන් උනා ඒකත් ඉවර උනා. ඊට පස්සේ ඔය වැඩ ටිකේදී පහළ වෙච්ච කුසල් සිත් පස්සේ වෙලාවකට එනකොට මේ කරපු ටික අපිට දැනෙන්නේ අතීත වශයෙන්. මේවා ඔක්කොම අතීතයට ගිහින්. හැබැයි දැන් ඉඳගෙන තමන්ගේ හිතින්

කරපු දානය තමන්ගේ හිතින් වඩපු සීලය තමන්ගේ සිතින් වඩපු උපෝසථ කර්මය මෙනෙහි කරනවා. **ගරුං කත්වා පච්චවෙක්ඛති** = හරියට ලොකු කරලා ගරු කරලා පස්සේ අරමුණු කරනවා. දැන් එතකොට අපිට පහළ වෙනවා අර පරණ පිං සිත. ඒ පරණ කුසල් සිත අරමුණු කරමින් දැන් පහළ වෙනවා මහා බලවත් කුසල් සිතක්. වර්තමානයේ පහළ වෙන මතුවෙන ඒ කුසල් සිත් පහළ වෙන්න අර ඉස්සෙල්ලා වෙලා පහළ වූ 'දාන සිත' 'සීල සිත' අරමුණු වෙනවා. එතකොට දැන් පහළ වෙන හිතට බලවත් උපකාරක ප්‍රත්‍යයට තමයි 'උපනිශ්‍රය ප්‍රත්‍යය' කියලා කියන්නේ. ඒ කියන්නේ ඉස්සරවෙලා කරපු එක තමයි බලවත්ම උපකාරක ධර්මය උනේ, බලවත්ම උපනිශ්‍රය ප්‍රත්‍යය උනේ. ඒකෙ එල්ලිලා තමයි මේතැන කුසල ධර්ම පහළ වෙන්නේ. ඔන්න බලන්න අපිට 'ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යය' කියන එක තේරුම් ගන්න පහසුවෙන විදිය.

තවත් එකක් බලමු. දැන් මනුස්සයෙක් හැටියට ඉන්නකොට ඔය දන්දෙන එකයි සිල් රකින එකයි උපෝසථ කර්ම කරන එක විතරක් නොවෙයි කරන්නේ. තව තියෙනවා හොඳ වැඩ. ඒ කියන්නේ මනුස්සයෙකුට උදව්වක් කරනඑක උපකාරයක් කරන එක. මනුස්සයෙක් අසනීප වෙලා ඉන්නකොට නාවන එක. උදේට පහනක් දල්වා හඳුන්කූරක් පත්තු කරලා බුදුන්වඳින එක. ඒවගේම බණ අහන එක. බණ කියන එක. අතු පතු ගෑම. ඇප උපස්ථාන කිරීම වගේ තව කරපු හොඳ වැඩ වලට කියනවා **පුබ්බෙ සුචිණ්ණානි** කියලා. ඉස්සර වෙලා කරපු මේ වගේ හොඳ වැඩ තිබෙනවා. අපි හිතමු අපි ගමනක් යනවා. ගමනක් යනකොට airport ඒකේ හරි පාරේදි හරි කෙනෙක් හම්බ වෙනවා. හම්බ උනාට පස්සේ මම මොකක් හරි බෑග් එකක් ගන්න හරි කෙනෙකුට බස් එකෙන් බහින්න හරි නගින්න හරි උදව්වක් කරනවා. ඕවා හොඳ වැඩ. **පුබ්බෙ සුචිණ්ණානි** = පෙර කළාවූ ඔය හොඳ වැඩ හොඳ දේවල් ගරු කරලා මෙනෙහි කරනවා. **ගරුං කත්වා පච්චවෙක්ඛන්ති** = තමන්ගේ හිතට හරියට ලොකු කරලා මෙනෙහි කරනවා. තමන් පළමුවෙන් කරපු දේවල් හොඳට මෙනෙහි කරනකොට මේ වේලාවේ කුසල් සිත් පහළ වෙන්න අරමුණු වෙන්නේ අර පරණ කරපු කුසල් සිත්. ඒක නිසා මේක 'ආරම්මණ උපනිශ්‍රය' ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීමක්.

ඊළඟට තව එකක් තිබෙනවා. ස්වාමීන්වහන්සේලත් යෝගී පිරිසත් භාවනා කරනවා. සමථ භාවනා වඩනවා විපස්සනා භාවනා වඩනවා. සමථ භාවනා වඩන කොට හිත ඒක තැන වෙනවා. සමථ භාවනා වල හැදෙනවා බලවත් චිත්ත ඒකාග්‍රතාවයන්. 'ප්‍රථම ධ්‍යානය' 'දුතිය ධ්‍යානය' 'තෘතිය ධ්‍යානය' 'චතුත්ථ ධ්‍යානය' වශයෙන් හිතේ එකාග්‍රතාවයන් හැදෙනවා. සමාධිගත භාවය හැදෙනවා. ඒ සමාධිගත භාවය හතරක් විදියට කියලා තිබෙන්නේ ඒ හතරේ තිබෙන්නා වූ ධ්‍යාන අංග සහ ඒ සමාධි වල තිබෙන බලවත්කම එකිනෙකට වෙනස්. ධ්‍යානයකට සම වැදිලා ඒ ධ්‍යානයෙන් එළියට ආපු කෙනාට ඒ ධ්‍යානය හරියට මතකයි. ධ්‍යානය ඇතුලේ තිබ්ච්ච ස්වභාවය හරියට හිතට කැවිලා කෙටිලා print වෙලා පවතිනවා. එහෙම ස්වභාවයක් ඕකේ තිබෙන්නේ.

- **ඣානා වුට්ඨහිත්වා ඣානං ගරුං කත්වා පච්චවෙක්ඛති**

ධ්‍යානයක් ඇතුලට ගිහිල්ලා ධ්‍යානයේ හිත හසුරුවලා ධ්‍යානයේ ඉඳලා ධ්‍යානයෙන් හිත බස්සනවා සාමාන්‍ය තත්වයට. සාමාන්‍ය තත්වයට පත්වෙලා ඊට පස්සේ අර ඉස්සරවෙලා තමන්ගේ හිත ගිය ධ්‍යානයේ පැත්තට හිත හරවල මතක් කරනවා. ඒකට කියනවා **පච්චවෙක්ඛති** කියලා. ඒ මතක් කරන්නේ 'මේක හරි හොඳ දෙයක්, මේක හරි ලොකු දෙයක්' කියලා ගරු කරලා මෙනෙහි කරනවා = **ගරුං කත්වා පච්චවෙක්ඛති**. ප්‍රත්‍යවේක්ෂා කරනවා. ඒ ප්‍රත්‍යය වේක්ෂා කරනකොට පරණ ධ්‍යානය මෙනෙහි කරනකොට දැන් තමන්ගේ හිතේ මහා බලවත් කුසල් සිත් පහළ වෙනවා. මේ කුසල් සිත් ටිකට අර ධ්‍යාන ආරම්මණය තමයි බලවත් උපනිශ්‍රය ආරම්මණය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන්නේ.

තව එකක් තිබෙනවා.

- **සෙක්ඛා ගොත්‍රභුං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති**

අපි හිතමු කෙනෙක් සෝවාන් වෙනවා කියලා. සෝවාන් වෙන වෙලාවේ එයා සෝවාන් තත්වයට පත්වෙලා ආපු මාර්ගය හිතනවා. එතකොට එයාට මතක් වෙනවා ගෝත්‍රභූ කියන්නා වූ චිත්තය. නිවනට හැරිච්ච තැන. පෘතක්ජන භාවයෙන් නිවන පැත්තට හැරිච්ච තැන මතක් වෙනවා. ඒ මතක් වෙනකොට සෝවාන් ආර්යන් වහන්සේට කුසල් සිත් පහළ වෙනවා අර ගෝත්‍රභූ සිත අරමුණු කරගෙන. ඒක නිසා කියනවා **සෙක්ඛා ගොත්‍රභුං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති** කියලා.

- **සෙක්ඛා මග්ගා වුට්ඨහිත්වා වොදානං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති**

සකෘදගාමි අනාගාමී යන දෙදෙනා වහන්සේ වෝදාන සිත අරමුණු කරනවා. එසේ අරමුණු කරනකොට කුසල් සිත් පහළ වෙනවා. ඒ කුසල් සිත්වලට අරමුණු වෙන්නේ අර වෝදාන සිත.

- **සෙක්ඛා මග්ගා වුට්ඨහිත්වා මග්ගං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති.**

ශෛක්ෂයන් වහන්සේලා මාර්ගයෙන් නැගී සිට මාර්ගය ගරු කොට ප්‍රත්‍යවේක්ෂා කරනවා.

දැන් මේ ටික කියාගෙන යනකොට පෘතක්ජන භාවයේ ඉඳලා උඩට යනකම්ම තිබෙනවා පිළිවෙලක්. කුසල් සිත් පහළ වෙනකොට ගරු කිරීම් වශයෙන් අරමුණු කරන අරමුණු ඔක්කොම ටික මේකේ අන්තර්ගතයි. මේකෙදි දැනගන්න ඕන **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස උපනිස්සයපච්චයෙන පච්චයො** = කුසල ධර්මයක් තවත් කුසල ධර්මයකට පහළ වීමට බලවත් ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙන විදිය කියන්නේ ඔන්න ඔය විදියටයි. මේක මේ විදියට අපි තේරුම් ගනිමු. ඒ තමයි අරමුණක් කොහොමද බලවත් උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන්නේ කියලා. හැබැයි මම මේ පින්වතුන්ට කියලා දෙන්නේ ආරම්මණ කථාව විතරයි. හේතුව අනිත් ටික ඈඳ ගත්තොත් මේ පින්වතුන්ට ඒක ග්‍රහණය කරගන්න අමාරු වෙයි කියලා මගේ හිතක් තිබෙන නිසා. තව

තිබෙනවා 'අනන්තර උපනිශ්‍රය ප්‍රත්‍යය' සහ 'ප්‍රකෘති උපනිශ්‍රය ප්‍රත්‍යය' කියන එක. අපිට ගොඩක් තිබෙනවා විස්තර කථා කරන්න.

තවත් චිත්ත වීථියක් තිබෙනවා

2) <u>දෙවෙනි වීථිය</u>

**කුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස උපනිස්සයපච්චයෙන පච්චයො – ආරම්මණූපනිස්සයො, පකතූපනිස්සයො** = කුසල ධර්මය අකුසල ධර්මය පහළ වෙන්නත් බලවත් උපනිශ්‍රය ප්‍රත්‍යයක් වෙනවා.

ඒ උපනිශ්‍රය භාවය වෙන්නේ කොහොමද කියලා අපි බලමු. පෘතක්ජනයන්ට මෙහෙම දෙයක් සිදු වෙනවා.

- **දානං දත්වා සීලං සමාදියිත්වා උපොසථකම්මං කත්වා තං ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති, තං ගරුං කත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති.**

දන් දීල සිල් සමාදන් වෙලා උපෝසථ කර්මයක් කරලා ඒ දාන සිත පොහොයට සිල් සමාදන් වෙලා උපෝසථ කර්මයක් කරලා ඒ සීලයට ඒ දාන සිත ට සිල් සමාදන් වෙනකොට පහළ වූ සිතට ලෝභ කරනවා. 'අනේ මම කර ගත්ත එය හරි වටිනවා. තව තව මේක වැඩෙන්න ඕන' කියලා ඒ හිත හරියට ආස්වාදනය කරනවා. අභිනන්දනය කරනවා. ඒක පිළිබඳව හරියට ලෝභ හිතනවා. එහෙම ලෝභ හිතනකොට පහළ වෙන්නේ ලෝභ සිතක්. ආස්වාදනය කරනවා කියලා කියන්නේ අභිනන්දනය කරනවා කියලා කියන්නේ අකුසල් සිතක්. මේ අකුසල් සිත පහළ වෙන්න බලවත් අරමුණක් ලෙස ඉදිරිපත් උනේ අර කියන්නා වූ දානය. ඒ රැකපු සීලය. මේ එකක්.

අනිත් එක තමයි **තං ගරුං කත්වා රාගො උප්පජ්ජති** = බලවත් බැඳීමක් ඇතිවෙනවා. **දිට්ඨි උප්පජ්ජති** = දිට්ඨිය උපදිනවා. 'මගේ පින' 'මගේ කුසල් සිත' 'මම පිනක් කළා' 'මම කුසලයක් කළා' 'මගේ සිත හරි බලවත්' කියලා ඒක මමායනය කරනවා. ඒක දෘෂ්ඨියක් කරගන්නවා. දෘෂ්ඨිය කියලා කියන්නේ මේ තමයි සියලු සම්පත් දෙන තැන කියලා කර්මය කර්ම ඵලය මත පිහිටන්නේ නැතුව ඒක දෘෂ්ඨියෙන් බාර ගන්නවා. දෘෂ්ඨිය කියලා කියන්නේ අකුසල සිතක්. ඒ දෘෂ්ඨි සහගත අකුසල සිතට අරමුණ වෙන්නේ අර දානයයි සීලයයි උපෝසථයයි.

මේ ගැන හරි පරෙස්සම් වෙන්න ඕනෑ මේ කාලේ. මේ කෑල්ල විතරක් අරගෙන highlight කරලා මේ සියලුදෙනාම අනිත් පැත්ත හරවන්න පුළුවන්. දෘෂ්ඨිගත කරන්න පුළුවන්. 'දානය දීල සිල් රැකලා උපෝසථ කර්මය කරලා ඒවා ගරු කරලා ආස්වාදනය කරලා අකුසල් සිත් පහළ වෙනවා නේද' කියලා ධර්මය දන්නේ නැති ආත්ම ශක්තියක් නැති හිතන්න බලයක් නැති කෙනෙකුට කියපු ගමන් ඒ මිත්‍යා කථාව හිස් මුදුනින් පිළිගන්නවා. ඒක නිසා මේ කාලේ හොඳට තේරුම් ගන්න ඕනෑ මේක කුසලයටත් උපනිශ්‍රය වෙනවා. අකුසලයටත් උපනිශ්‍රය වෙනවා. මේක පහළ වෙන විදිය දිහයි බලන්න ඕන වෙන්නේ.

අනිත් එක

- **පුබ්බෙ සුචිණ්ණානි ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති, තං ගරුං කත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති.**

ඉස්සර වෙලා කරපු හොඳ දේවල් ලොකුවට ලොකුවට හිත හිතා හිත හිතා 'මගේ වැඩ මං කරපු දේවල්' කියලා ආස්වාදනය කරනවා. ඒවගේම ඒවා ගරු කරලා හිතනවා. එතකොට දෘෂ්ඨිය උපදිනවා. ඒවගේම තමයි එතකොට රාගය වැඩෙනවා. බැඳීම් ඇතිවෙනවා. ඒ අකුසල් සිත්. ඒ වාගේම තමයි ආත්ම දෘෂ්ඨියකුත් ඕකට දානවා.

- **ඣානා වුට්ඨහිත්වා ඣානං ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති, තං ගරුං කත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති**

ධ්‍යානයකින් එළියට ඇවිල්ලා 'අනේ මගේ ධ්‍යානය' කියලා හරියට ඒ සිතට ආසා කරනවා. ඒක මෙනෙහි කිරීම හොඳයි නමුත් ආසා කිරීම රාගය උපදවා ගැනීම ලෝභ කිරීම මගේ ධ්‍යාන සිත කියලා දෘෂ්ඨියෙන් ගැනීම අකුසල් සිත් පහළ කරගැනීමක්. මේ විදියට අකුසලයටත් ආරම්මණයක් හැටියට උපනිශ්‍රය භාවයෙන් ඉස්සරහට එනවා. මතු වෙනවා.

තවත් තිබෙනවා මෙහෙම. තමන්ට ශ්‍රද්ධාවන්ත හිතක් පහළ උනහම 'අනේ මගේ ශ්‍රද්ධාව කොච්චර වටිනවද' කියලා ග්‍රහණය කර ගැනීමක් තිබෙනවා. මේක වැඩිපුර කියවෙන්නේ ප්‍රකූර්තිය පිළිබඳව කියන කොටයි. පෘතක්ජනයා තමයි ඕවාට ගොඩක්ම ඇලීමක් ඇතිකරගන්නේ. සෝවාන් වෙච්ච ආර්යන් වහන්සේලා දානය දෙනකොට 'අනේ මගේ සිත්' කියලා දෘෂ්ඨි වශයෙන් ගන්නේ නෑ. ඒ ඒ ආර්ය ඵල වලට අනුව බෙදීම් තිබෙනවා. ඒක නිසා එතැනදී විශේෂයෙන්ම කථා කරන්නේ මේ කියන්නා වූ පෘතක්ජනයන්ගේ සිත් පිළිබඳවයි.

උපනිශ්‍රය ප්‍රත්‍යය යටතේ විශාල පරාසයක් තිබෙනවා කථා කරන්න.

ඊළඟට තවත් වීථි විග්‍රයක් බලමු.

3) <u>තුන්වෙනි වීථිය</u>

**කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස උපනිස්සයපච්චයෙන පච්චයො – ආරම්මණූපනිස්සයො, අනන්තරූපනිස්සයො, පකතූපනිස්සයො.**

කුසල ධර්මය අව්‍යාකෘත ධර්ම වලටත් මහා බලවත් උපනිශ්‍රය ප්‍රත්‍යයයක් වෙනවා ආරම්මණයක් වශයෙන්. අව්‍යාකෘතය ධර්ම තිබෙනවා මෙහෙම. රූපයට කියනවා අව්‍යාකෘතය කියලා. විපාකයට කියනවා අව්‍යාකෘතය කියලා. ක්‍රියා සිත්වලට කියනවා අව්‍යාකෘතය කියලා. නිර්වාණයට කියනවා අව්‍යාකෘතය කියලා. මේ අව්‍යාකෘත සිත් පහළ වෙන්න කුසල ධර්ම උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් මෙලෙසින් ප්‍රත්‍යය වෙනවා.

- **අරහා මග්ගා වුට්ඨහිත්වා මග්ගං ගරුං කත්වා පච්චවෙක්ඛති**

රහතන්වහන්සේලා රහත් උනාට පස්සේ පහළ වෙන්නේ ක්‍රියා සිත්. උන්වහන්සේලාට කුසල් සිත් පහළ වෙන්නේ නෑ. ඒ ක්‍රියා සිත් වලින් රහතන්වහන්සේ ගේ මාර්ගය පිළිබඳව උන්වහන්සේ රහත් භාවයට පත්වූ මාර්ග සිත පිළිබඳව ආපහු හැරී බලනවා. 'මම කලින් වේලාවක රහත් උනා. ඒ නිවන මට හසු උනේ මෙහෙමයි' කියලා ඒ රහතන්වහන්සේ පස්සේ වේලාවක ඒ සිත මෙනෙහි කරනවා. එහෙම මෙනෙහි කරනකොට ඒ රහතන්වහන්සේට පහළ වෙන්නේ ක්‍රියා සිත්. ඒවා කුසල් සිත් වෙන්නේ නෑ. ඒවා අකුසලුත් නොවෙයි. ඒවාට විපාක දීමේ ශක්තියක් නෑ. එතකොට ඒ ක්‍රියා කියන අව්‍යාකෘත සිත් පහළ වෙන්නේ අර මාර්ගය කියන එක අරමුණු කරගෙන. එවිට ඒ රහතන්වහන්සේගේ මාර්ග සිත අව්‍යාකෘත වූ ක්‍රියා සිත් පහළ වෙන්න 'ආරම්මණය උපනිශ්‍රය ප්‍රත්‍යය භාවයෙන්' ප්‍රත්‍යය වෙනවා.

මේ තමයි රහතන්වහන්සේගේ සිතේ තිබෙන්නා වූ ස්වභාවය.

ඊළඟට

## 4) <u>හතර වෙනි වීථිය</u>

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස උපනිස්සයපච්චයෙන පච්චයො – ආරම්මණූපනිස්සයො, අනන්තරූපනිස්සයො, පකතූපනිස්සයො.**

අකුසල ධර්ම එනම් 'ලෝභ සිත්' 'ද්වේශ සිත්' 'මෝහ සිත්' තවත් අකුසල සිත් වලට මහා බලවත් ආරම්මණ උපනිශ්‍රය ස්වභාවයෙන් ඉදිරිපත් වෙනවා.

- **රාගං ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති, තං ගරුං කත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති**

රාගය ගරුකරලා ආස්වාදනය කරනවා. අභිනන්දනය කරනවා. රාගය ලොකු දෙයක් හොඳ දෙයක් හැටියට අස්වාදනය කරනවා අභිනන්දනය කරනවා. ඒක ගැන ඇලෙනවා. එතකොට ඉස්සරවෙලා පහළ වෙච්ච රාග සිත පස්සේ හිත හිතා අරමුණු කරනවා. **තං ගරුං කත්වා රාගො උප්පජ්ජති** = පරණ රාග සිතක් අල්ලාගෙන ඒකට ලෝභ කරමින් ඇලෙන කොට පස්සේ පහළ වෙන්නෙත් අකුසල් සිත්මයි. ඒකනිසා කියනවා අකුසලය මුල් කරගෙන අකුසල් පහළ වෙනවා. ඒකට මේ අකුසල් සිත් ආරම්මණයක් ලෙස බලවත් උපනිශ්‍රය ස්වභාවයෙන් බලපානවා කියලා.

තවත් දෙයක් තිබෙනවා. අපි හිතමු ප්‍රායෝගිකව ගත්තහම කෙනෙකුට තරහක් එනවා. තරහක් ඇවිල්ලා බණිනවා. හොඳට බැණලා බැණලා 'මම සෑහුව කථා කළා, මම එයාට හොඳට කිව්වා' කියලා මේ විදියට ඒ බැණපු විදිය ඒ කියපු දේවල් ගැන හොඳට තව තව අගය කරමින් සිතුවිලි පහළ කරනවා. එතකොට මාන්නය වැඩෙනවා. දෘෂ්ඨිය වැඩෙනවා. අහංකාර කම වැඩෙනවා. මේ ඔක්කොම අකුසල්. මෙවැනි සිත් පහළ වෙන්නත් බලවත් ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන්නේ අකුසල්මයි. ඔය විදියට තමයි අකුසල ධර්මයක් අකුසල ධර්මයකට ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනහැටි තේරුම් ගන්නේ.

තවත් මෙහෙම තිබෙනවා. ප්‍රාණඝාතයක් කරනවා. ප්‍රාණඝාතය කරලා ඒ ප්‍රාණඝාතය මෙහෙමයි කළේ කියලා ඒ පිළිබඳව ලෝභ කර කර ඒක කරපු විදිය මාන්න කර කර දෘෂ්ඨියෙන් අරගෙන අරමුණු කරනවා. එතැනත් අකුසල් සිත් පහළ වෙන්න පෙර කළාවූ අකුසලය මහා බලවත් විදියට උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. සොරකම් කිරීම වරදවා හැසිරීම බොරු කීම ආදී අකුසල ධර්මයන් සෑම දේකටම යෙදෙන්නේ ඔය විදියටයි.

5) **වෙනි වීථිය**

**අකුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස උපනිස්සයපච්චයෙන පච්චයො පකතූපනිස්සයො**

අකුසල ධර්මය කුසල ධර්මයකටත් ආරම්මණ ප්‍රත්‍යයෙන් බලපානවා. මේක තමයි අපි කළයුතු වෙන්නේ බොහෝසෙයින්. පෘතක්ජනභාවයේ ඉන්න අය අකුසල් සිතක් පහළ උනහම ඒ අකුසල් සිත දිහා මනසිකාරය කරනවා. එහෙම මනසිකාරය කරනකොට තේරුම් ගන්නවා මේක අකුසල් සිතක් මේකේ වරදක් තිබෙන්නේ මේකේ පාපයක් තිබෙන්නේ කියලා ඒ අකුසල සිත තුල තිබෙන චෛතසික ධර්ම හෝ සිතෙහි ස්වභාවය හෝ මෙනෙහි කරන කොට කුසල් සිත් පහළ වෙනවා. 'අකුසල් සිතක් පහළ උනා' කියලා දැන ගන්නවා. 'මාන්න සිතක් ඇති උනා' කියලා දැන ගන්නවා. 'තරහ සිතක් ඇති උනා' කියලා මෙනෙහි කරනවා. ඒ තරහවේ තිබෙන ස්වභාවය අගේ කරන්නේ නෑ. ඒකෙ තිබෙන වරද ඒකෙ තිබෙන කටුකත්වය ඒකෙ තිබෙන දරුණු ස්වභාවය මෙනෙහි කරනවා. එතකොට ඇතිවෙන්නේ කුසල් සිත්.

සතිපට්ඨාන සූත්‍රයේ දක්වනවා මෙහෙම. කාමච්ඡන්දයක් පහළ උනා නම් ඒ කාමච්ඡන්දය කාමච්ඡන්දයක් කියලා හඳුනාගන්නවා. එතකොට අකුසල ධර්මය මුල් කරගෙන ඒක බලන මෙනෙහි කරන කුසල ධර්මයක් මතුවෙනවා. **අකුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස උපනිස්සයපච්චයෙන පච්චයො** කියන **එක වෙන්නේ ඔය විදියටයි.**

6) <u>**හය වෙනි වීථිය**</u>

**අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස උපනිස්සයපච්චයෙන පච්චයො – අනන්තරූපනිස්සයො, පකතූපනිස්සයො.**

අකුසල ධර්මයක් කොහොමද ස්වභාවයෙන්ම අව්‍යාකෘත ධර්මයකට උපනිශ්‍රය භාවයෙන් ඉදිරිපත් වෙන්නේ කියලා බලමු. ඒක වෙන විදිය මෙහෙමයි. මේ පින්වතුන් දැනගෙන තිබෙනවා චිත්ත වීථි යනහැටි. අපි යමක් දකින කොට සිත් පෙළක් යනවා. යමක් අහනකොට සිත් පෙළක් යනවා. ඇත්තටම අපිට ඕක දැනෙන්නේ නෑ. ඒක ඇතුලත ක්‍රියාත්මක වෙන චිත්ත නියාමයට අනුව වැඩ කරන එකක්. නැතුව චිත්ත වීථි ගියා ඒ චිත්ත විථිවලින් තමයි අපි දන්නේ දකින්නේ අහන්නේ කියලවත් අපිට ඒ වෙලාවට තේරෙන්නේ වැටහෙන්නේ නෑ. නමුත් අපි ඒ වෙලාවට කිඳා බැහැගෙන රස විඳන්නේ අරමුණයි. ඒ අරමුණ රස විඳිනවා. ඒ අරමුණට බැස ගන්නවා. අරමුණේ ඉන්නවා. ඒ වෙලාවට ඇතුලේ යන්නේ රස විඳින චිත්ත වීථි. ඒකෙ තිබෙනවා ජවන් ජේළිය කියලා එකක්. යමකට අපි ලෝභ කරනකොට ඒ ලෝභ කරන්නේ ජවන් සිත් වලින්. ඒ ජවන්

සිත් වල තමයි අකුසල් වැඩ කරන්නේ. ජවන් සිත් හතක් ගිහිල්ලා කෙළවර පහළ වෙනවා ඒ ජවන් සිත්වලට සමාන සිතක් හෝ දෙකක්. ඒවා ජවන් සිත් නොවෙයි. ජවන් සිත් වගේ හැඩක් තිබෙන විපාක සිත් ජාතියක්. ඒවාට කියනවා **තදාරම්මණ** කියලා. ඒ තදාරම්මණ සිත අකුසල සිතක් පහළ උනාට පස්සේ පහළ වෙන නිසා එතැන අනන්තර භාවයෙන් ඇතිවෙන බලවත්ම උපනිශ්‍රය ස්වභාවයක් තිබෙනවා. මේ එකක්, තේරුම් ගන්න.

අනිත් එක තමයි, අකුසල කර්මයක් කළහම ඒක විපාකයට එනවා. විපාකය කියලා කියන්නේ අව්‍යාකෘතයක්. අව්‍යාකෘතයට ඉස්සෙල්ලා කරපු අකුසලය බලපානවා.

තවත් එකක් තිබෙනවා.

## 7) <u>හත්වෙනි වීථිය</u>

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස උපනිස්සයපච්චයෙන පච්චයො – ආරම්මණූපනිස්සයො, අනන්තරූපනිස්සයො, පකතූපනිස්සයො.**

කොහොමද කුසල් නොවෙන අකුසල් නොවෙන ධර්මයක් අව්‍යාකෘත ධර්මයකට උපනිශ්‍රය ස්වභාවයෙන් බලපාන්නේ කියලා බලමු. අපි ගමු රහත් භාවයට පත්වෙච්ච රහතන්වහන්සේ නමක් දානය වළඳලා පොඩි විවේකයකින් ඉඳලා උන්වහන්සේ රහත් ඵල සමාපත්තියට සමවදිනවා. රහත් ඵල සමාපත්තියට සමවැදුනහම ඒක විපාකයක්. ඒ විපාක සිත ඒ රහත් ඵල සිත පස්සේ මෙනෙහි කරනවා. 'මම ඵල සිතට සමවැදිලා නිවන් අරමුණු කරගෙන හිටියා' කියලා මෙනෙහි කරනකොට රහතන්වහන්සේගේ සිතේ පහළ වෙන්නේ ක්‍රියා සිත් කොටසක්. එවිට ඒ ක්‍රියා සිතුත් අව්‍යාකෘතයි ඵල සිතුත් විපාක වශයෙන් අව්‍යාකෘතයි. එවිට අරමුණුවෙන නිර්වාණ ධාතුවත් අව්‍යාකෘතයි. ඒක නිසා කියනවා **අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස උපනිස්සයපච්චයෙන පච්චයො** කියලා.

මෙන්න මේ ටික තමයි මම අද මේ පින්වතුන්ට මේ වෙලාවේ මතක් කරන්නේ. එතකොට අපි කියලා දුන්නා ආරම්මණ උපනිශ්‍රය ස්වභාවය යටතේ කුසලයක් කොහොමද කුසලයකයකට බලපාන්නේ, කුසලයක් කොහොමද අකුසලයකට ආරම්මණ උපනිශ්‍රය ස්වභාවයෙන් බලපාන්නේ, කුසලයක් කොහොමද අව්‍යාකෘතයට උපනිශ්‍රය ස්වභාවයෙන් බලපාන්නේ අකුසලය කොහොමද මේ කාරණා වලට බලපාන්නේ කියලා මේ වෙලාවේදී මේ පින්වතුන්ට සාමාන්‍ය තේරෙන ස්වභාවයකින් බොහොම සරලා කරලා ගොඩක් විස්තර කථනයකට යන්නේ නැතුව මේ උපනිශ්‍රය ප්‍රත්‍යයයේ පින්තූරය උපනිශ්‍රය ප්‍රත්‍යයයේ තිබෙන සැබෑ ස්වභාවය තේරුම් ගන්න මේ ආරම්මණ උපනිශ්‍රය ඉදිරිපත් කරගෙන කියලා දුන්නා. අපි හිතනවා මේ පින්වතුන්ට යම් තරම් වැටහීමක් මේ තුලින් එන්න ඇති කියලා.

තව එකක් කියන්න ඕනෑ. අභිධර්මයේ මේ වගේ තැන් මේ උපනිශ්‍රය ප්‍රත්‍යය වගේ දේවල් බලනකොට මේ වගේ එකක් තිබෙනවා. මනුස්සයෙක් බත් කනකොට අපි හිතමු එයා පිඩු ගානට ගණන් කරගෙන කනවා කියලා. එයා බත් පිඩු පහක් කනවා. බත් පිඩු පහක් කියලා

කිව්වට ඒකෙ තිබෙන්නේ බත් ඇට සහ curries රාශියකින් සෑදුම්ලත් ආහාර පිණ්ඩයක්. එතකොට මේ පට්ඨානය ගත්තොත් එහෙම පිඩු ගණන් කිරීමක් නොවෙයි හරියට බත් ඇට ගණන් කිරීමක් සහ ඒකෙ ඇතුලේ තිබෙන්නා වූ එහි අන්තර්ගත වෙච්ච පුංචි වෙනත් වෙනත් ද්‍රව්‍ය මෙනෙහි කිරීමක් වාගේම කොහොමද ඒවා එකිනෙකට බලපාන්නේ කියලා බලනවා වගේ සියුම් තැනක් තමයි මේ හොයන්නේ බලන්නේ.

ඇත්තටම අපි ගොඩක් බණ අහනවා. මෙනෙහි කරනවා. මේ බණ අහන කෙනා ආත්මයක් නොවෙයි. ජීවයක් නොවෙයි. චිත්ත චෛතසික ධර්මයන්ගේ ක්‍රියා කාරී ස්වභාවයක්. අද මේ පින්වතුන් ඔය ඉන්න ඉන්න තැන් වලට ආවේ ආත්මයක් හැටියට නොවෙයි. පුද්ගලයෙක් හැටියට නොවෙයි. ජීවයක් හැටියට නොවෙයි. තමාගේ හිතේ ඡන්දය කියන කුසල චෛතසිකයක් ඉදිරිපත් වෙලා වීර්ය ඉදිරිපත් වෙලා රූපස්කන්ධය ඇතුළු පංච ස්කන්ධයම තැන් තැන් වල වාඩි කෙරෙව්වේ විචාරය විතර්කය ඡන්දය වීරිය වගේ චෛතසික රාශියක් එක්ක හැදිච්ච සිත් වලින්. ඒක නිසා මේ සිත් ඒවගේ දේවල් එහෙට මෙහෙට හසුරුවන බල ධර්ම මිසක ඕවා 'ආත්ම' 'සත්ව' 'ජීව' නොවෙයි. වෙලා තිබෙන්නේ මේවා එක පොදියට තැන් තැන්වල හිත්වල රංචු රංචු එකිනෙකාට උදව් උපකාර වෙමින් විවිධ ස්වරූපයේ බල තිබෙන ධර්ම ගුලි ගුලි කුට්ටි කුට්ටි අර බත් පිඩක් වගේ පහළ වෙනවා. එහෙම නැතුව මෙතැන බණ අහන එක්කෙනෙක් වත් බණ කියන එක්කෙනෙක් වත් මතුවෙන්නේ නෑ. පහළ වෙන්නේ නෑ. හොයා ගන්න බෑ. ඉතින් මේ කාරණය තේරුම් ගන්න මේ විස්තර කථනයක් එක්ක යන අභිධර්ම විග්‍රය හරියට උදව් වෙනවා උපකාර වෙනවා. ආත්ම සංඥාව නසන්න හරි අමාරුයි. එය සමහර අයගේ හරි තදේට කිඳා බැහැලා තිබෙනවා. ඒ කිඳා බැහැලා තිබෙන්නේ මනසිකාරය නැති නිසා. ඒක නිසා මේ මනසිකාරය කරගෙන යනකොට හැම දෙනාටම මේ කියන්නා වූ අකුසල ධර්මයන්ගෙන් මිදිලා අව්‍යාකෘතය කියන්නා වූ පරම ශාන්ත වූ නිර්වාණයට සැපත්වෙන්න පුළුවන්. ඒ නිසා අද මේ කියලා දීපු ධර්ම කොට්ඨාසය සැම දෙනාටම උපකාරයක් හේතුවක් ඒවගේම උපනිශ්‍රය ස්වභාවයෙන් පිහිට වීමක් වේවා! සැම දෙනාටම චතුරාර්ය සත්‍යය ධර්මයන් අවබෝධ කරගෙන අමාමහ නිවනින් සැනසෙන්න ලැබේවා! කියලා අපි මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස අපි කලින් කථා කළා කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස උපනිස්සයපච්චයෙන පච්චයො කියන එක. ඒකේදී රහතන්වහන්සේ නමක් තමන්ගේ මාර්ගය ගරු කිරීමක් හැටියට විතරයි තිබෙන්නේ. එතකොට රහතන්වහන්සේලා ඊට පල්ලෙහා කුසල් ගරු කරලා සලකන්නේ නැත්ද කියන ප්‍රශ්නය තමයි මතු උනේ. ඒවගේම පළවෙනි එකේ කිව්වා දානය දීලා සීලය රකලා ඒවා නැවත හිතීමෙන් රාගය ඇතිවෙනවා කියලා. හැබැයි ඒකෙම කුසල් නිසා අකුසලයක් උපදින අවස්ථාවේදී සේක පුද්ගලයෝ ගෝත්‍රභූ සිත මෙනෙහි කරලා අකුසලයක් උපදවනවා කියන වීථියක් තිබුණේ නෑ. නමුත් පෘතක්ජන අයට ධ්‍යානයක් උනත් අකුසල් උපදවන්න හේතුවක් වෙලා තිබෙනවා. සෙක්ඛා කියන තැනේදී ගෝත්‍රභූ සිත හරි මාර්ග සිත හරි අරමුණු කරලා

අකුසල් උපදින එකක් සඳහන් වෙලා නෑ ස්වාමීන්වහන්ස. ඒකට විශේෂ හේතුවක් තිබෙනවද?

<u>පිළිතුර</u> - ඒකට හේතුව තමයි සේක කියන තැන මේ කථාවේදී දෙන්නෙක් ගැන සඳහන් කරනවා, නමුත් සේක පුද්ගලයෝ ඉන්නවා තුන් දෙනෙක්. ඒ තමයි සෝවාන් සකෘදාගාමී අනාගාමී කියන ආර්යන් වහන්සේලා. සෝවාන් වෙනකොට ඒ සෝවාන් උනාවූ ආර්යන් වහන්සේගේ හිතේ සක්කාය දිට්ඨිය ගිය නිසා විචිකිච්ඡාව ගිය නිසා සීලබ්බත පරාමාසය කියන එක ගිය නිසා දිට්ඨිගත කරන එකට යන්නේ නෑ.

ඊළඟට ඔය සකෘදාගාමී අනාගාමී කියන සේක පුද්ගලයන් දෙන්නත් පිනක් කාරයින් පස්සේ 'මේක මම හොඳට කරගත්ත පිනක්' කියලා මමායනය කරලා දෘෂ්ඨියෙන් ගන්නේ නෑ. ඒවගේම තමයි 'මගේ මේ පිං, මේ කුසලය මමයි කරගත්තේ' කියලා ඒ තත්වයට පත්වෙන්නේ නෑ. ඒවගේම තමයි ඒක හේතුවක ධර්මයක් හැටියට උන්වහන්සේලා දකිනවා. ඒක නිසා ඒ 'කුසල් සිත' කියන එක ආරම්මණය හැටියට ගන්නේ නෑ. දානයදීලා ඒ කුසල් සිත ආස්වාදනය කරන්නේ නෑ.

නමුත් සෝවාන් ආර්යන් වහන්සේ බාහිර ලෝකයේ රූපයකට ඇලුම් කරන වගේ දේවල් තිබෙනවා. ඒවා **දානං දත්වා සීලං සමාදියිත්වා** කියන කොටසට යන එකක් නොවෙයි. ඒවගේ දේවල් ආරම්මණ භාවයෙන් සිදු උනාට ඉස්සරවෙලා තිබුණ සිත අරමුණු කරගෙන සේකයන් වහන්සේලාට මාන්නය ඇති වෙන්නේ නෑ. ඒවා අරමුණු කරමින් දෘෂ්ඨිය ඇති වෙන්නේ නෑ. ඒවා අරමුණු කරමින් තරහාවල් ඇති වෙන්නේ නෑ. ඒක නිසා තමයි මේ චිත්ත වීථි විග්‍රහයේදී ඒ ටික අතහැරලා තිබෙන්නේ.

ජයන්ත මහත්මයා - අප්‍රමාණ පිං ස්වාමීන්වහන්ස. ඔබවහන්සේට සවනට සිසිලස වෙනුවෙන් අප්‍රමාණ වාරයක් පුණ්‍යානුමෝදනා කරනවා අපට මේ දහම් දැනුම් ගෙන දෙනවට. ඔබ වහන්සේට ඉතාමත්ම ගෞරවයෙන් යොමුවෙනවා අද දවසේ සාකච්ඡාව නිමා කරන්න ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - අපේ පින්වත් සැමදෙනාටම සැනසිල්ලක් යහපතක් වේවා! අද දවසෙත් අපි මේ කාලය වෙන් කරගෙන මේ ධර්මය සාකච්ඡා කරන්න ඉදිරිපත් උනේ අපේ පෙර පිනක් නිසා. පෙර පුණ්‍යබලයක් නිසා ශක්තියක් නිසා. කල්‍යාණමිත්‍ර ආශ්‍ර සම්පත්තිය නිසා. පින්වත් ලලිත් දළුවත්ත මහත්මයා මේකේ කොටස් කාරයෙක්. ඒ පින්වත් මහත්මයාටත් ඒ පවුලේ සැම දෙනාටමත් ජයන්ත මහත්මයා ඉදිරිපත් වෙලා බොහෝම කරුණාවෙන් සම්බන්ධීකරණය කටයුතු .................(line got disconnected)

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්බෙත්තං අනුත්තරං

දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං

සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා

සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.